සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved]

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 11 | විෂයය Subject: පුරවැසි අධ්‍යාපනය I Civic Education I | කාලය Time: පැය 01යි 01 hour |

නම : - ................................................ ශ්‍රේණිය :- ................................

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම වන්නේ,
    (1) රෝමය (2) ග්‍රීසිය (3) බ්‍රිතාන්‍යය (4) ප්‍රංශය

02. පරමාධිපත්‍ය බලයට අයත් නොවන අංගයකි.
    (1) මූලික අයිතිවාසිකම් (2) ඡන්ද බලය (3) පක්ෂ ක්‍රමය (4) පාලන බලතල

03. ලංකාවම එකම මැතිවරණ කොට්ඨාසයක් බවට පත්වන්නේ,
    (1) මහා මැතිවරණයේදී ය. (2) ජනාධිපතිවරණයේදී ය.
    (3) පළාත් පාලන මැතිවරණයේ දී ය. (4) පළාත් සභා මැතිවරණයේ දී ය.

04. "බාහිර සාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව නිදහසයි." මෙය ප්‍රකාශ කරන ලද්දේ,
    (1) ඒබ්‍රහම් ලින්කන් ය. (2) හැරල්ඩ් ලැස්කි ය.
    (3) ජී. සී. එස් කෝල් ය. (4) සීලර් ය.

05. ජාතික රාජ්‍ය යුරෝපය තුළ ස්ථාපිත වන්නේ,
    (1) 10 වන සියවසෙන් පසුව ය. (2) 05 වන සියවසෙන් පසුව ය.
    (3) 12 නවන සියවසෙන් පසුව ය. (4) 15 වන සියවසෙන් පසුව ය.

06. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක රාජ්‍යයකින් ඉටු විය යුතු යුතුකමක් වන්නේ,
    (1) සමාජ සිරිත්වලට ගරු කිරීම (2) නියමිත කාලයට මැතිවරණ පැවැත්වීම
    (3) නීතිය හා සාමය ආරක්ෂා කිරීම (4) විධායකය සමග එක්ව කටයුතු කිරීම

07. බලය බෙදීම හා බලය විමධ්‍යගත කිරීම පිළිවෙළින් ක්‍රියාත්මක වන රාජ්‍යයන් දෙකකි.
    (1) ප්‍රංශය, ඇමරිකාව (2) ලංකාව, ඇමරිකාව
    (3) ස්විට්සර්ලන්තය, ඉන්දියාව (4) ස්විට්සර්ලන්තය, ලංකාව

- **8 - 10 සඳහා පිළිතුරු සැපයීමට පහත වගන්ති උපකරණ කරගන්න.**

A. ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධයාක හා අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් ක්‍රියාත්මක කිරීම.
B. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.
C. විශාල රාජ්‍යයක් නිසා එක තැනක සිට පාලන කටයුතු කරගෙන යාමේ අපහසුතාව
D. ව්‍යවස්ථාව නිරූපණය කිරීම ඉහළ අධිකරණයට පැවරීම
E. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම
F. පාලනයේ පහසුව සඳහා පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකකවලට විමධ්‍යගත කිරීම

08. ඒකීය රාජ්‍යයක ලක්ෂණ නිවැරදිව සඳහන් වී ඇති වරණය වන්නේ
(1) A E (2) A D (3) A F (4) A C

09. සන්ධීය රාජ්‍යයක ලක්ෂණ අඩංගු වී ඇති නිවැරදි පිළිතුර වන්නේ,
(1) C D (2) D E (3) C D (4) C E

10. නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට හේතු ඇතුළත් වරණය
(1) BC (2) BD (3) BF (4) FC

11. වර්තමානයේ ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත සංඛ්‍යාව
(1) 12 කි. (2) 35 කි. (3) 43 කි. (4) 50 කි.

12. පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ කවුරුන්ද?
(1) නාමකරණයෙනි. (2) ජනාධිපතිවරයා විසිනි.
(3) මහඇමති විසිනි. (4) මහජන ඡන්දයෙනි.

13. සෝමාලියා, ඉතියෝපියා රටවල ඇති වූ ගැටුම් නිර්මාණය වූයේ,
(1) වාර්ගික ගැටුමක් නිසාය. (2) දේශපාලන ගැටුමක් නිසාය.
(3) ආගමික ගැටුමක් නිසාය. (4) ආර්ථික ගැටුමක් නිසාය.

14. ස්විට්සර්ලන්තයේ මධ්‍යම රජය සතු බලතලයකි.
(1) ආරක්ෂක හා හමුදා කටයුතු (2) මහා මාර්ග
(3) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන (4) ආගමන

15. ''වෙනස්කම් තුළින් එකමුතු බව යන්න'' තේමා කොටගෙන දියුණු වූ රටකි.
(1) ප්‍රංශය (2) සිංගප්පූරුව (3) ඉන්දියාව (4) ලංකාව

16. සංකීර්ණ බහු සංස්කෘතියක් පවතින රටකි.
(1) ඉන්දියාව (2) ලංකාව (3) පකිස්ථානය (4) නේපාලය

17. ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය
(1) රෝම ලන්දේසි නීතියයි. (2) ජාත්‍යන්තර නීතියයි.
(3) උඩරට නීතියයි. (4) තේසවලාමේ නීතියයි.

18. පාලන කටයුතුවලදී සෘජුවම ජනතාව පාලන කටයුතුවලට සහභාගි වන අවස්ථාවකි.
(1) ජනාධිපතිවරණය (2) මහ මැතිවරණය
(3) ජනමත විචාරණය (4) පළාත් සභා මැතිවරණය

19. ලංකාවේ අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ බලය ඇති ආයතනය
(1) මහේස්ත්‍රාත් අධිකරණය (2) මහාධිකරණය
(3) අභියාචනා අධිකරණය (4) ශ්‍රේෂ්ඨාධිකරණය

20. කාති උසාවි පිහිටුවීම සිදුවන්නේ
(1) 1938 වසරේදී ය. (2) 1929 වසරේදී ය
(3) 1927 වසරේදී ය. (4) 1937 වසරේදී ය.

21. ලන්දේසි යුගයේ ප්‍රධාන අධිකරණ ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්කය කුමක් ද?
(1) ත්‍රිකුණාමලය (2) මහනුවර (3) මාතර (4) යාපනය

22. රටේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,
(1) අධිකරණ ඇමති ය. (2) ජනාධිපතිවරයා ය.
(3) නීතිපතිවරයා ය. (4) අග්‍රවිනිශ්චයකාරවරයා ය.

23. ලංකාවේ අපරාධ නීතියට අනුව බරපතල වැරැද්දකි.
(1) රාජ්‍ය විරෝධී ක්‍රියා
(2) මැතිවරණ සම්බන්ධ ක්‍රියා
(3) රාජ්‍ය සේවකයන් සම්බන්ධ ක්‍රියා
(4) ආදායම් පිළිබඳ නඩු

24. ඔම්බුඩ්ස්මන් තනතුර ඇති කරනු ලැබූයේ,
(1) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
(2) 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
(3) 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
(4) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

25. ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක සංඛ්‍යාවක් ඇතුළත් පළාත වන්නේ,
(1) ඌව පළාත (2) නැගෙනහිර පළාත (3) දකුණු පළාත (4) උතුරු පළාත

26. මූලික අයිතිවාසිකම් ලෙස හඳුන්වන්නේ,
(1) උපතින්ම හිමිවන අයිතිවාසිකම් ය.
(2) මූලික නීතියට ඇතුළත් අයිතිවාසිකම් ය.
(3) සියලු දෙනාට ම පොදු වූ අයිතිවාසිකම් ය.
(4) ජාත්‍යන්තර අයිතිවාසිකම් ය.

27. ළමා අයිතිවාසිකම් කඩවීමක දී ක්ෂණිකව දැනුම් දිය හැකි දුරකථන අංකය
(1) 1990 (2) 1987 (3) 1929 (4) 1969

28. ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවනු ලැබුවේ
(1) 1996 අංක 21 දරන පනත මගිනි.
(2) 1986 අංක 21 දරන පනත මගිනි.
(3) 1993 අංක 21 දරන පනත මගිනි.
(4) 1984 අංක 21 දරන පනත මගිනි.

29. ලංකාවේ ප්‍රථම වරට පුරවැසියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබුණේ,
(1) 1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(2) 1910 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(3) 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(4) 1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.

30. ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත් වූයේ
(1) 1972 වසරේදී ය. (2) 1978 වසරේදී ය. (3) 1948 වසරේදී ය. (4) 1931 වසරේදී ය.

31. මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා කළ හැකි කාර්යයකි.
(1) පොත් කියවීම
(2) මිතුරු ඇසුර
(3) ආගමික වතාවත් කිරීම
(4) රූපවාහිනිය නැරඹීම

32. ජය - ජය විසඳුම ලබාගත හැකි ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමයකි.
(1) කේවල් කිරීම (2) මැදිහත්කරණය (3) සාකච්ඡා කිරීම (4) බේරුම්කරණය

33. ගැටුමක් නිර්මාණය වීමට බලපාන මනෝවිද්‍යාත්මක සාධකය කුමක් ද?
(1) ආකෘතිය (2) චර්යාව (3) සන්දර්භය (4) ආකල්ප

34. අන්තර්ජාතික ගැටුම් ඇතිවීම කෙරෙහි බලනොපාන සාධකයකි.
(1) ආර්ථික ප්‍රතිලාභ (2) වාර්ගිකත්වය (3) සම්පත් (4) බල ව්‍යාප්තිය

35. ධනවාදී වෙළඳපල ලක්ෂණ බහුලව දක්නට ලැබෙන වෙළඳපළ ආර්ථිකයක් ක්‍රියාත්මක වන ආසියාතික රටකි.
(1) චීනය (2) සිංගප්පූරුව (3) කියුබාව (4) පිලිපීනය

36. නව ලිබරල්වාදී ආර්ථිකයක දක්නට ලැබෙන ලක්ෂණයකි.
(1) පාලන නීතිරීති සීමා අවම කිරීම
(2) රාජ්‍ය ව්‍යවසාය ඉහළ මට්ටමක පැවතීම
(3) ආනයන අපනයන බදු පැනවීම
(4) පෞද්ගලික දේපල අයිතිය සීමා කිරීම

37. අතීතයේ සිට පැවත එන ඇදහිලි, සිරිත් විරිත් ජීවන ක්‍රම ඒ අයුරින් පවත්වාගෙන යාමට පසුබිම සකස් කිරීම ප්‍රධාන අරමුණ කරගත් සම්මුතිය
(1) ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් (2) ජ්‍යෙෂ්ඨ පුද්ගලයන් පිළිබඳ අයිතිවාසිකම්
(3) ආදිවාසීන් පිළිබඳ අයිතිවාසිකම් (4) කම්කරුවන් පිළිබඳ අයිතිවාසිකම්

38. 1980 දී සම්මත කරන ලද ජාතික පාරිසරික පනතට අනුව ක්‍රියාත්මක වන කේන්ද්‍රීය ආයතනය වන්නේ,
(1) පරිසර අමාත්‍යාංශය (2) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
(3) මධ්‍යම පරිසර අධිකාරිය (4) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

39. තේසවලාමේ නීතිය මගින් උතුරු පළාතේ හා මන්නාරම් දිස්ත්‍රික්කයේ දෙමළ ජනතාවගේ පාලනය වන කරුණු මොනවාද?
(1) මුදල් හා දේපල (2) දේපල හා සිරිත්
(3) උරුම අයිතිවාසිකම් හා සිරිත් (4) උරුම අයිතිවාසිකම් හා දේපල

40. ගැටුම් නිරාකරණයේ දී සමථකරණය යොදාගත හැකි අවස්ථාවකි.
(1) කම්කරු අරවුල් විසඳීමට (2) අසල්වාසීන් සමග ඇති ආරවුල් විසඳීමට
(3) මුදල් පිළිබඳ ආරවුල් විසඳීමට (4) ජාතීන් අතර ඇතිවන ආරවුල් විසඳීමට